**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2018**

-----------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක  පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන
------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-----------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.259,964,609 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමක් මේ දක්වා සිදුකොට නොමැති අතර, එම වත්කම් සියල්ල නැවත තක්සේරු කිරීමට (Revaluation) සැලසුම් කොට ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුගමනය කලයුතු වේ. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.246,723 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ 2019 වර්ෂයේදී ගෙවන ලද රු.340,490 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් උපචිත පදනම අනුව ගිණුම් සකස් කිරීමේදී ප්‍රායෝගිකව ගිණුම්ගත කල හැකි වියදම් අදාළ වර්ෂය හි වියදමක් ලෙස ගිණුම් ගත කෙරේ. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය උපචිත පදනම වන නිසා ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීමේ උපලේඛනය අනුව ශේෂය රු. 31,529,645 ක්වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.31,966,934 ක් වූයෙන් සේවක පාරිතෝෂිත වෙන් කිරීමේ ගිණුමේ රු.437,289 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. රු.437,289/- ක මුදල පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්වල අදාළ ගැලපීම් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග විෂයන් 03 ක අවසන් තොගයේ වටිනාකම රු.31,621,585 ක්වූ අතර ඉදිරිපත් කරන ලද තොග සමීක්ෂණ වාර්තා අනුව ගණනය කළ අවසන් තොගයේ වටිනාකම රු.30,683,466 ක් වූයෙන් රු.938,119 ක් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණයේ දී හඳුනාගෙන තිබුණු රු.531,901 ක අපහරණය කල යුතු තොගයක් ද ඉහත තොගය තුළ ඇතුලත් වී තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් තොගයේ වටිනාකම හා තොග සමීක්ෂණ වාර්තා අනුව තොගයේ වටිනාකම අතර වෙනස පැහැදිලි කිරීමට පහත සැසඳුම ඉදිරිපත් කරමි.<br><u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව තොගය</u><br>රු. / රු.<br>ලිපිද්‍රව්‍ය තොගය 6,662,819.25<br>නඩත්තු තොග හා වෙනත් 1,176,069.85<br>විදුලි උපාංග <u>400,182.80</u> 8,239,071.90<br>**<u>එකතු කළා</u>**<br>නැවත ගිණුම් ගත කළ තොගය (Continuous Papers) 16,750.00<br>අතිරික්ත තොගයේ වටිනාකම <u>52060.79</u> 68,810.79 | මෙම වෙනස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |

| | | |
|---|---|---|
| <u>අඩුකළා</u> | | |
| ඌණ තොගවල වටිනාකම | (14,226.08) | |
| භාවිතා කළ නොහැකි වූ තොගයේ වටිනාකම | <u>(530,680.70)</u> | (544,906.78) |
| හඳුනාගත් වෙනස | | <u>(110,680.66)</u> |
| තොග සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | | <u>7,652,295.25</u> |

රු.110,680/= ක් වූ වෙනස පිළිබඳ පරීක්ෂා කොට අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

**1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

---

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 190,104,996 | 185,672,916 | 4,432,080 | වෙනස පිළිගන්නා අතර, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

---

| | අධිකාරි බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගණන් දීමේ නිලධාරියෙකු විසින් මාණ්ඩලික නිලධාරියෙකුට එක් වරකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම මුදල රු.100,000 ක් වුවත් සමාලෝචිත වර්ෂය තුලදී එම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී රු.3,485,093 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණු අතර ඒ සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලයට ආවේණික අත්‍යාවශ්‍ය කටයුතු සිදු කිරීමේදී රු.100,000 ඉක්මවා අත්තිකාරම් ගෙවීම් සිදු කොට ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2015 හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 05/2015 අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැක්කේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් වුව ද මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 252 කදී රු.4,987,433 ක අග්‍රිම ලබාදී තිබුණි. | මාණ්ඩලික නොවන නිළධාරීන් සඳහා අත්තිකාරම් ගෙවීම් සිදු කොට ඇත්තේ අදාල අංශ ප්‍රධානි/ මාණ්ඩලික නිළධාරීන් යටතේ එකවර විශේෂිත කාර්යයන් කිහිපයක් සිදු කිරීමේදී එම මාණ්ඩලික නිළධාරීන් එකවර අත්තිකාරම් මුදල් කිහිපයක් ගෙවීම වැලැක්වීම සඳහා වේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2015 හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 05/2015 අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2018 පෙබරවාරි 27 දින සිට 2018 මාර්තු 07 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති පුහුණු වැඩමුළුවක් සඳහා නිලධාරියෙකු විදේශ ගත වී තිබුණු අතර රටින් බැහැරව යෑම සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාල ලිපි අංක UWU/HR/PF/4/0001 හා 2018 පෙබරවාරි 15 දිනැති (දින 11 කට පෙර) ලිපිය මගින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් හරහා ජනාධිපති ලේකම්වරයා වෙත යොමු කර ඇත.<br>උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් උක්ත අයදුම්පත්‍රය ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ජනාධිපති ලේකම් වෙත යොමු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යැවීමට කටයුතු කල නොහැකි බව දන්වා එවා ඇත. | විදේශගත වීමට පෙර අදාළ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) | 2016 අගෝස්තු මස 10 දිනැති අංක 18/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික මට්ටමේ නිලධරයන් ඇතුලුව සියළුම නිලධරයන් විදේශගත වීමේදී ගරු අමාත්‍යතුමාගෙන් නිවාඩු අනුමත කරවා ගත යුතු වුවද නිලධාරීන් තිදෙනෙක් එසේ කර නොතිබුණි. | අග්‍රාමාත්‍ය කාර්යාලයේ අංක PMO/2/1/MICS/FL හා 2015 අප්‍රේල් 07 දිනැති ලිපියේ උපකරුණු අංක 01 යටතේ සඳහන් කරුණු අර්ථ නිරූපණයේ දී සිදුවූ දෝෂයක් හේතුවෙන් ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර නොමැත. එහෙත් 2018 ජුලි මස සිට විධායක නිලධාරීන් නොවන අයගේ විදෙස් සංචාර අමාත්‍යවරයාගේ | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. | |

**1.5.6 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීමේ දී එම කාර්යයට අවශ්‍ය ඇස්තමේන්තුවක් සකස් කර තිබුණ ද සියයට 25 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් අවස්ථා 223 ක් පැවතුනි. | අවශ්‍ය වන මුදලට සරිලන ඇස්තමේන්තු සකසන ලෙස කාර්ය මණ්ඩලයට උපදෙස් දී ඇති අතර ඉදිරියේදී නිවැරදි ඇස්තමේන්තු වලට අනුව මුදල් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඇස්තමේන්තුව නිවැරදිව සකස් කල යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු වලදී යොදාගන්නා ඌව පළාත් සභාවේ ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR) තුළ අඩංගු පොදු උපදෙස් තුළ වැඩ සුපරීක්ෂණය සහ වැඩ බිම් ආරක්ෂාව වැනි පොදු කාර්යය පිරිවැය සඳහා වන සියයට 10 ක් සෑම රේටයක් (Rate) තුළම ඇතුළත් වන බැවින් වැඩ සුපරීක්ෂණය සහ ආරක්ෂාව සඳහා වෙනම ගෙවීමක් විශ්වවිද්‍යාලය පිළියෙල කරන ඇස්තමේන්තු වල ඇතුලත් කළ නොහැකිය. එසේ වුවද නියදි පදනමක් මත සිදුකළ පරීක්ෂාවේදී කර්මාන්ත 03 ක් සඳහා වැඩ සුපරීක්ෂණය සඳහා රු.155,250 ක් සහ වැඩබිම් ආරක්ෂාව සඳහා රු.247,250 ක් ලෙස රු. 402,500 ක් ඇතුළත් කර ගෙවා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු සාකච්ඡාවේදී ඌව පළාත් ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR) පිළියෙල කරන කමිටුවේ සාමාජික මහතාගේ අදහස වූයේ පොදුකාර්ය පිරිවැය යටතේ දක්වා ඇති වැඩබිම් සුපරීක්ෂණය හා වැඩබිම් ආරක්ෂාව සාමාන්‍ය තත්වයන් යටතේ දක්වා ඇති අතර, ඊට අමතරව අදාල ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාට අවශය වුවහොත් CIDA ලේඛණයන්ට අනුකූලව අදාල කාර්යයේ ස්වාභාවය අනුව විශේෂිත කාර්ය මණ්ඩල හා අයිතමයන් යම් කිසි කාල පරිච්ජේදයකට අදාල ප්‍රමාණ පත්‍ර (BOQ) සඳහා ඇතුලත් කිරීමට බලය ඇති බව පෙන්වා දෙන ලදී. | ඌව පළාත් සභාවේ BSR රේටයන්හි පොදු කාර්යය පිරිවැයේ සුපරීක්ෂණය හා වැඩබිම් ආරක්ෂාව ඇතුලත් වන බැවින් ඒ සඳහා වෙනම ගෙවීමක් ඇතුලත් නොකළ යුතුය. |

**1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 1,984,409,725 | • විධිමත් ස්ථාවර වත්කම් ලේඛන<br>• භාණ්ඩ සමීක්ෂණ වාර්තා | 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වී ඇති අතර වාර්තා ලබා දීමට කටයුතු කරමි. | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කල යුතු අතර මුදල් රෙගුලාසි 756 හා 757 අනුව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |

## 1.6 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී අතරුදවුම් වශයෙන් රදවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.21,362,955 ක තැන්පතු නිරවුල් කර නොතිබුණි. එමෙන්ම කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා ද පිළියෙල කර නොතිබුණි. | ඉදිකිරීම් සම්බන්ධව අතරුදවුම් මුදල් අවසන් බිල්පත්‍ර නිරවුල් වූ පසුව නිදහස් කිරීමට කටයුතු කරන අතර, අනෙකුත් වත්කම් මිලදී ගැනීමට අදාලව රදවා ගත් මුදල් කොන්දේසි සම්පූර්ණ කල පසුව නිදහස් කිරීමට කටයුතු කරමි. අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 715 (2) | තොග ගබඩාවේ භාණ්ඩ ක්‍රමානුකූලව ගබඩා කර නොතිබුණි. | ක්‍රමානුකූලව පවත්වාගෙන යන ලෙසට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | |
| | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7:2 ඡේදය | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. | අවසාන මෙහෙයුම් වාර්තා සකස් කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | | | |
| | XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා | වැටුප් අංශය මඟින් අදාල අධ්‍යයන අංශ ප්‍රධානින්ගෙන් අධ්‍යයන | 2009 ජූනි 17 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන |

| | | | | |
|---|---|---|---|---|
| | | නිවාඩු තහවුරු කර නොගෙන වැටුප් හා දීමනා ලෙස රු.354,565,436 ක් ගෙවා තිබුණි. | කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් ලබා ගෙන වැටුප් හා වේතන ගෙවනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ**<br>----------------------- | | | |
| | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස 03 ක් ඇතුළත නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග 14 ක ප්‍රතිඵල නිකුත් කිරීමේදී ප්‍රමාදයන් සිදුවී තිබුණි. | විභාග ප්‍රතිඵල ප්‍රමාදයන්ගෙන් තොරව නිකුත් කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS system) හඳුන්වා දීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>----------------- | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය සතු වාහන 03 ක් විසින් කරන ලද ප්‍රවාහන සේවා පිළිබඳ චක්‍රලේඛය අනුව විධිමත් මාසික සටහනක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | බස් රථ වලට අදාල මාසික ප්‍රවාහන සේවා සටහනක් යාවත්කාලීන කොට ඇති අතර, ඉන්ධන දහනය පිළිබද පරීක්ෂාවක් කිරීමට මෝටර් රථ ප්‍රවාහන අංශයෙන් ඉල්ලීමක් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඊ)** | **ජනාධිපති චක්‍රලේඛ**<br>----------- | | | |
| | ජනාධිපති ලේකම්ගේ 2012 ජූනි 11 දිනැති අංක සී.එස්.ඒ/1/1/16 දරන ලිපිය | විදේශ සංචාරය නිමවා දිවයිනට පැමිණ සති 02ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තා ලබා නොදුන් ආචාර්යවරු හා නිළධාරීන් වෙත, අදාළ වාර්තාව ලබා දෙන ලෙස ලිඛිතව දැනුම් දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුව ද අවස්ථා 73 කදී ලබාදී තිබුණු අග්‍රිම රු.2,178,920 ක් මාස 01 සිට මාස 04 දක්වා කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. | කාර්යය අවසන් වූ සැනින් අග්‍රිම පියවීමට, අදාල පාර්ශවයන් දැනුවත් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.168,999,621 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.85,587,906 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.83,411,715 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වියදම් වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ආදායම් රැස් කිරීම ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට (28) සිට සියයට 37 දක්වා පරාසයක වෙනස් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ වියදම් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට (30) සිට සියයට 60 දක්වා පරාසයක වෙනස් වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය 1:1.39 ක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:1.88 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී 0.49 ක පිරිහීමක් නිරීක්ෂණය විය. එමෙන්ම ඉකුත් වර්ෂයේ ක්ෂණික අනුපාතය 1:2.04 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී 1:2.79 ක් වීමෙන් 0.75 ක පිරිහීමක් ද නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 හා 2018 වර්ෂවල උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 1,662 ක් බඳවාගත යුතුව තිබුණ ද සිසුන් 1,439 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 223 ක් අඩුවෙන් ඇතුලත් කර ගැනීම තුලින් සම්පූර්ණ ධාරිතාවය උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | විශ්වවිද්‍යාලය විසින් අදාල පුරප්පාඩු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම අනුව 2018 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය 11 වන ස්ථානයේ පැවතුන ද 2019 අප්‍රේල් 01 දින වන විට එය 13 වන ස්ථානයට පත් වී තිබුණි. | ශ්‍රේණිගත කිරීම් ඉහල නැංවීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා, අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුලින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම විශ්වවිද්‍යාලයේ අරමුණක් වී තිබුණ ද 2016 හා 2017 වර්ෂ වලදී එක් විදේශීය සිසුවෙකු බැගින් බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු සිසුවෙකු බඳවා ගෙන නොතිබුණි. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලද විදේශ ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. | අරමුණ ඉටු කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 2005 පෙබරවාරි 10 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීම සඳහා ලබා දීමට නියමිතව තිබුණු කර්මාන්ත අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 30.9667 ක ඉඩම් විශ්වවිද්‍යාලයට පවරාගෙන නොතිබුණි. | කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වූ ඉඩම් විශ්වවිද්‍යාලයට පැවරීම 2009 වසරේ සිට ප්‍රමාදවී ඇත්තේ එම ඉඩම කර්මාන්ත අමාත්‍යාංශයට ද නීත්‍යානුකූලව පවරා නොතිබුනු බැවිනි. එම නිසා මේවනවිට විශ්වවිද්‍යාලය විසින් ඉඩම් අමාත්‍යාංශය වෙත උක්ත ඉඩම පවරා ගැනීම සඳහා නැවතත් අයදුම්පතක් ඉදිරිපත්කර ඇත.එසේම මෙම ඉඩමේ | ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කර්මාන්ත කරුවන් 06 දෙනෙකු දැනට තාවකාලිකව පදිංචිව ඇත. මොවුන් මෙම ඉඩමෙන් ඉවත්කිරීමට විශ්වවිද්‍යාලය, උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ අදාල බලධාරීන් වෙත දිගින් දිගටම ඉල්ලීම් කිරීමෙන් පසු 2019.02.27 දින කැබිනට් පත්‍රිකා අංක අ.ම.ප/19/0379/110/020 යටතේ වන්දි කමිටුවක් ස්ථාපිත කරන ලදී. එම කමිටුවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගනුලබන බව දන්වමි. | |
| (ඉ) | විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර 13 ක් ගත වී තිබුණ ද ස්වයං මූල්‍ය ආදායම් මාර්ගයන් ලෙසට විශ්වවිද්‍යාලය විසින් බාහිර උපාධි හෝ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කර නොතිබුණි. | **ව්‍යාපාර කළමනාකරණවේදී බාහිර උපාධි පාඨමාලාව හා ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව 2019 වර්ෂය තුළදී ආරම්භ කිරීමට අපේක්ෂිත අතර තොරතුරු තාක්ෂණ බාහිර උපාධි පාඨමාලාවේ හා විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාවේ** විෂය නිර්දේශ සහ යෝජනාවලිය අනුමැතිය හා ඇගයීම් සඳහා ඉදිරිපත් කර තිබේ.<br><br>**සත්ත්ව හා ශාක නිෂ්පාදනය පිළිබඳ විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාවක්** ආරම්භ කිරීම සඳහා ද කටයුතු කෙරෙමින් පවතී. | බාහිර උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය සිසුන් 1,019 කට නේවාසිකාගාර පහසුකම් සපයා තිබුණු අතර ඉන් සියයට 50 ක් හෙවත් සිසුන් 511 කට කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර වල පහසුකම් සලසා තිබුණි. එමෙන්ම, 2015 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුළ මෙලෙස කුලී පදනම මත සිසුන්ට නේවාසිකාගාර පහසුකම් සැලසීම වෙනුවෙන් රු.44,221,235 ක් ගෙවා තිබුණි. විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර ඉදිකිරිම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. | විශ්වවිද්‍යාලයේ සිසුන් හා කාර්ය මණ්ඩල වෙනුවෙන් නව නේවාසිකාගාර ඉදිකිරීම් සඳහා කටයුතු කිරීම් හා සැලසුම් සකස් කිරීම් සිදුකර ඇත. | යෝජිත ඉඩම් පවරා ගැනීමේ කාර්යය කඩිනමින් සිදු කර නේවාසිකාගාර ඉදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩ මිළදී ගැනීමේදී අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම කෙරෙහි අවධානය යොමු නොකර පහත සඳහන් පරිදි භාණ්ඩ මිලදී ගෙන තිබුණි.<br><br>(i) 2015 වර්ෂයේ මිළදී ගෙන තිබුණු රු.543,714 ක් වටිනා A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 591 ක් ප්‍රයෝජනයට නොගෙන තිබුණි.<br><br>(ii) 2017 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.93,500 ක් වටිනා සිස්ටම් ෆිටින් සෙට් හැන්ඩ්ල් ටයිප් (System Fitting Set Handle Type) ඒකක 170 ක් ප්‍රයෝජනයට නොගෙන තිබුණි. | A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි විභාග අංශයේ ප්‍රයෝජනය සඳහා යොදා ගනු ලබන බව දන්වා සිටිමි. Handle type system fittings බාහිරව ලබා ගන්නා නේවාසිකාගාරවල අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය වන බවත් ඒවා වෙළඳපොලේ හිඟයක් පවතින නිසා වැඩි ප්‍රමාණයක් මිලදී ගෙන ඇත. | අවශ්‍යතාවය අධ්‍යයනය කර පවතින තොග මට්ටම් පිළිබඳ සලකා බලා මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තාව අනුව රු.15,006 ක් වටිනා තොග විෂයයන් 23 කට අයත් භාණ්ඩ ඒකක 634 ක ඌනතාවයක් හා රු.52,061 ක් වටිනා තොග විෂයයන් 31 කට අයත් භාණ්ඩ ඒකක 222 ක අතිරික්තයක් තිබුණු අතර ඒවා සම්බන්ධයෙන් සොයා බලා අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තොග සමීක්ෂණ වාර්තාවට අනුව හඳුනා ගත් අතිරික්ත හා ඌන තොග සම්බන්ධයෙන් අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධක අරමුදලෙහි එකතුව වූ රු.4,736,843 ක් සමාලෝචිත වර්ෂය තුල කිසිඳු ප්‍රයෝජනයකට නොගැනීම නිසා අදාළ අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි. | ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධන අරමුදල යන අරමුදල් වල මුදල් භාවිතයට ගැනීමට අවස්ථාවන් ඇති නොවූ බැවින් ඒවා තව දුරටත් ආයෝජනය කිරීමට කටයුතු කරන ලදී. | අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂි පාදක කර්මාන්ත වල ආර්ථික ඵලදායිතාවය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය සහ රජයේ පුහුණු මධ්‍යස්ථාන වල ඵලදායිතාවය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා 2018 වර්ෂයේදී ලබා දී තිබුණු රු.591,250 ක මුදලින් රු.397,290 ක් උපයෝජනය කර නොතිබුණි. | ක්ෂේත්‍ර අධ්‍යයනය කටයුතු අවසන්ව ඇති අතර අදාළ ගෙවීම් කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. | බාහිර අයතනයන්ගෙන් ලැබෙන්නා වූ අරමුදල් අදාළ නිශ්චිත කාර්යයන් කෙරෙහි කාලීනව අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා යෙදවිය යුතුය. |
| (ඇ) | 2017 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ විවිධ වැඩසටහන් සඳහා ඌව පළාත් සභාවෙන් ලැබී තිබුණු රු.100,000 ක් උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘතියට අදාළව ඌව පළාත් සභාවෙන් ලද රු.100,000 ක මුදල, ව්‍යාපෘති සම්බන්ධීකාරකගේ නිර්දේශය මත නැවත ගෙවීමට කටයුතු කරමි. | අරමුදල් අදාළ ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා උපයෝජනය කල යුතුය. |

**3.4 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මගින් රු.2,657,499 ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු රෝද 02 ට්‍රැක්ටර් රථය, රෝද 04 ට්‍රැක්ටර් රථය සහ නඟුල හා උපාංග එම අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | තාක්ෂණික පීඨය සඳහා දැනට සිසුන් කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇති අතර, ඔවුන්ගේ 4 වන වසරේ I&II අර්ධ වාර්ෂික වල විෂය නිර්දේශයට අයත් BET in Mechanical Engineering පාඨමාලා මොඩියුල වල ප්‍රායෝගික ඉගැනුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ යන්ත්‍ර හා උපකරණ යෙදවීමට කටයුතු කරනු ලබයි. තවද අදාළ යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් සිසුන් සඳහා වැඩමුළුවක් පවත්වා ඇත.<br><br>ඊට අමතරව සාමාන්‍ය පරිපාලන කටයුතු වලට යොදවා ගනී. | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කරගැනීම සඳහා භාවිතා කල යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු.5,240,300 ක් වටිනා ප්‍රෙෂර් ප්ලේට් ඇපරේටර්ස් (Pressure Plate Apparatus) උපකරණය අදාළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. | උපකරණය අධික පීඩනයක් යටතේ ක්‍රියාත්මක වන නිසා ආරක්ෂාකාරීව උපකරණය භාවිතා කිරීම සඳහා ස්ථිරව සාදන ලද වෙන්වූ ස්ථානයක් අවශ්‍ය වේ. ඒ සඳහා ස්ථානයක් වෙන් කරගෙන ඇති අතර උපකරණය කිහිපවතාවක් (Trials) භාවිතා කර ඇත. | සිසුන්ගේ ආරක්ෂාව තහවුරු වන අයුරින් ශිෂ්‍ය ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කරවිය යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය පුරප්පාඩු 05 ක් හා කථිකාචාර්ය පුරප්පාඩු 36 ක් පුරවා නොතිබුණි. | 2019 දෙවන කාර්තුවේ සිට සිව්වන කාර්තුව දක්වා ඉතිරි තනතුරු පුරප්පාඩු පිරවීමට සැලසුම් කොට ඇත. | කඩිනමින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 73 ක් පුරවා නොතිබුණි. | පරිපාලන හා විධායක තනතුරු සඳහා බඳවාගැනීමේ කටයුතු කෙරෙමින් පවතී.<br><br>අනධ්‍යන කාර්යමණ්ඩල පුරප්පාඩු 34 ක් පිරවීමට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 876 අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් රේඛීය අමාත්‍යාංශය දැනුවත් කිරීම් කර ඇත. | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. |
| (i) | විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට මේ දක්වා පුරප්පාඩුව පවතින පුස්තකාලාධිපති තනතුර ඒ සඳහා පුස්තකාලාධිපතිවරයෙකු පත් නොකර 123 වන පාලක සභාවේ අනුමැතිය මත සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති 2017 අගෝස්තු 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා පුස්තකාලාධිපති ලෙස පත්කර 2019 ජනවාරි 25 දින 139 වන පාලක සභා තීරණය මත ඇගේ ධූරකාලය 2019 පෙබරවාරි 01 දින සිට 2019 අප්‍රේල් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. | පුස්තකාලාධිපති තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | ස්ථිරවම පුස්තකාලාධිපති තනතුර පිරවීමට පියවර ගත යුතුය. |
| (ii) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට පුරප්පාඩුව පවතින ඉංජිනේරු තනතුරට සුදුසු අයෙකු බඳවා නොගෙන එම තනතුර සඳහා ඌව පළාත් සභා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා 2015 දෙසැම්බර් 02 දින සිට මාසිකව රු.50,000 ක දීමනාවක් ගෙවීමේ පදනම මත අර්ධ කාලීනව පත්කර තිබුණි. | 2019 දෙවන කාර්තුවේදී අදාළ බඳවාගැනීම් සිදුකිරීමට සැලසුම් කර ඇත. | විශ්වවිද්‍යාලය සඳහා ස්ථිර ඉංජිනේරුවරයෙකු බඳවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට 2017 වර්ෂයට පෙර ට්‍රැක්ටර් 02 ක් ද 2017 වර්ෂය තුල බස්රථ 03 ක් ද මිල දී ගෙන තිබුණු නමුත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ස්ථිර රියදුරන් බඳවා ගැනීමට කටයුතු නොකර විශ්වවිද්‍යාලයේ ශ්‍රම සැපයුම් වැඩසටහන යටතේ දෛනික දීමනා ගෙවීම මත පුද්ගලයන් හතර දෙනෙකු පත්කර තිබුණි. | 2017 අගෝස්තු මස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ස්ථිර රියදුරන් 05 දෙනෙකු සඳහා අනුමැතිය ඉල්ලා ඇත. | රියදුරු තනතුරු අනුමත කරවාගෙන ස්ථිර රියදුරන් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

### 4.1 සංයුක්ත සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකර ගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සංශෝධනයට ලක්වන අතර ඒ මත ක්‍රියාකාරී සැලැස්මද සංශෝධනයන් සහිතව ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර සංයුක්ත සැලැස්මෙහි සහ ක්‍රියාකාරී සැලැස්මෙහි සියලු අයිතම සඳහා මූල්‍ය අගයන් ඇතුලත් කළ නොහැකි අතර ප්‍රධාන ඉලක්කයන් සඳහා මූල්‍ය අගයන් ඇතුලත් කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 4.2 අයවැය පාලනය

------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී සංශෝධිත අයවැය ලේඛනය අනුව රැස් කිරීමට අපේක්ෂිත ස්වයං මූල්‍ය වැඩසටහන් වල ආදායම රු.5,875,000 ක් වුව ද සත්‍ය ආදායම රු.3,499,377 ක් වී තිබුණි. | අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව සහභාගි නොවීම හේතුවෙන් සත්‍ය ආදායම අඩු වී ඇත. | අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව සහභාගී කරගෙන සම්පත් පූර්ණ උපයෝජනයට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්ථන වියදම් යටතේ ස්වයං මූල්‍යා වැඩසටහන් සඳහා ගෙවන ලද රු.2,278,443 ක වියදම පුනරාවර්ථන වියදම් අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදි එය නිවැරදි කිරිමට කටයුතු කරමි. | නිවරදිව ඇස්තමේන්තු සකස් කල යුතුය. |
| (ඇ) | සංශෝධිත අයවැය ප්‍රතිපාදන අනුව රු.650,000,000 ක් ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු කර තිබුණු අතර තථ්‍ය වියදම රු.428,192,858 ක් වූයෙන් රු.221,807,142 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් විය. එමෙන්ම වැය විෂයයන් 08 ක් සඳහා සලස්වා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 74 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මාසික මුදල් පුරෝකථන වාර්තාවට අනුව ඉල්ලීම් කරන ලද ප්‍රාග්ධන මුදල් නියමිත පරිදි නොලැබීම හේතුකොට ගෙන සමස්ථ ප්‍රාග්ධන වියදමේ ප්‍රගතිය අඩු වූ බව දන්වමි.<br>පර්යේෂණ සඳහා ඇණවුම් පත් ඉදිරිපත් කරන ලද රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් උපකරණ සියල්ල නියමිත කාලයක් තුලදි සැපයුම් කරුවන් විසින් අදාල භාණ්ඩ සැපයීම් නොකිරීම,<br>සැලසුම් කරණ ලද පුනරාවර්තන වැඩසටහන් නියමිත කාල සීමාවකදි අවසන් කිරීමට නොහැකිවීම,<br>සැලසුම් හා ඉදිකිරීම් ක්‍රමවේදය යටතේ ඉදිකිරීමට යෝජිත පුස්තකාල ගොඩනැගිල්ල අපේක්ෂිත කාල සීමාව තුලදී අදාල ටෙන්ඩරය ප්‍රදානය කිරිමට නොහැකි වීම,<br>Quality Assurance වෘත්තිය මාර්ගෝපදේශ හා ව්‍යවසායකත්ව වැඩසටහන් වලට අදාලව සැලසුම් කරන ලද වැඩසටහන් නියමිත කාල සීමාව තුල අවසන් කිරීමට නොහැකි වීම,<br>වත්කම් මිලදී ගැනිම යටතේ සත්‍ය වියදම රු.135,042,767 ක් වුවද එදිනට මිලදී ගැනිමේ ඇනවුම් නිකුත්කොට එහෙත් සැපයුම් කරුවන් භාණ්ඩ සපයා නොමැති ඇනවුම්පත් වල වටිනාකම රු.61,080,759 කි (Committed). ඒ අනුව ප්‍රතිපාදන ඉතිරි කිරීම ප්‍රතිශතයක් ලෙස 5% කි.<br>තාක්ෂණික විෂය ධාරාවට අදාළව ඇණවුම් කල විද්‍යාගාර උපකරණ අපේක්ෂිත දිනයන්හි විශ්වවිද්‍යාලය වෙත සපයා නොමැතිවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | නිවරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂ 04 ක් සඳහා ජල පරිභෝජනය වෙනුවෙන් රු.19,695,753 ක් වැයකර තිබුණු අතර, බැහැර කරන අපජලය වාහන සේදීම හා අනෙකුත් විවිධ නඩත්තු කටයුතු සඳහා උපයෝජනය කිරීම් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | පිරිපහදු පද්ධතිය මගින් ඉවතට දමන ජලය, වැසි ජලය, උල්පත් ජලය භාවිතා කිරීම සඳහා දැනට ජාතික ජලසම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මගින් ලබාගන්නා ජලයත් කළමණාකරනය කර ගැනීම සඳහා කැබිනට් අනුමැතිය මත ක්‍රියාත්මක කරනු ලබන Alternative Water Supply පද්ධතිය යටතේ කටයුතු සංවිධානය කර ඇත. | පිරිපහදු කරන ජලය නිසි ජල කළමනාකාරීත්වයකින් යුතුව භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ “තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” ප්‍රකාරව ළඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ දැනුවත්භාවයක් ලබා තිබුණ ද පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව ය.<br><br>(i) තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම.<br><br>(ii) තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීම. | විශ්වවිද්‍යාලය විසින් නිශ්චිත වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක නිර්මාණය නොකලද, ක්‍රියාකාරී සැලැස්මෙහි හා සංයුක්ත සැලැස්මෙහි 04, 05, 06 හා 09 යන ඉලක්කයන් ආවරණය වන පරිදි කාර්ය සාධනයේ යෙදේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගත යුතුය. ඒවා මැනීම සඳහා දර්ශක හඳුනාගත යුතු ය. |